# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 14,726/1 — 1966 දෙසැම්බර් 16 වැනි සිකුරාදා — 1966.12.16**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ඇල්.ඩී.—බී 36/57.

### 1957 අංක 49 දරණ රජයේ කාර්මික නීතිගත සංස්ථා පනත

**33 වන වගන්තිය යටතේ ආඥාව**

1957 අංක 49 දරණ රජයේ කාර්මික නීතිගත සංස්ථා පනතේ 33 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කර්මාන්ත හා ධීවර ඇමති, දොන් පිලිප් රූපසිංහ ගුණවර්ධන වන මම, ඉහත කී පනතේ 2 වැනි වගන්තිය යටතේ පනවනු ලැබ, 1966 මැයි මස 10 වැනි දින අංක 14,694/14 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නීතිගත කිරීමේ ආඥාවෙන් පිහිටුවන ලද නීතිගත සංස්ථාවක් වන රජයේ පොහොර නිපදවීමේ නීතිගත සංස්ථාවේ කාර්‍යයන් සඳහා මීට යාකොට ඇති උපලේඛනයේ නිශ්චිතව සඳහන් නිශ්චල දේපළ අත්කර ගැනීමේ යෝජනාව මෙ ආඥාවෙන් අනුමත කරමි.

ඩී. පී. ආර්. ගුණවර්ධන,<br>
කර්මාන්ත හා ධීවර ඇමති.

1966 දෙසැම්බර් මස 15 වැනි දින,<br>
කොළඹ දී ය.

### උපලේඛනය

**ඔස්තාහිර පලාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, බටහිර සියනෑ කෝරළයේ, අධිකාරි පත්තුවේ පට්ටිවිල සහ ගෝනවල ග්‍රාමයන් තුළ පිහිටි පහත දක්වෙන මායිම්වලට අයත් අක්කර 135 ක් පමණ වූ සියලුම බිම් ප්‍රදේශය සහ එහි පිහිටි ගොඩනැගිලි.**

| | |
|---|---|
| උතුරට : | ඒ. එල්. කබ්රාල්, ජී. පී. යූ. කපිලසේන සහ තවත් අය හිමිකම් කියනු ලබන මාකුල්ලගහකුඹුර, බක්මී ගහකුඹුර, නාකටිගෙකුඹුර සහ හල්ගහකුඹුර නමැති කුඹුරුවලට මායිම්වද, ගෝනවල ග්‍රාමයට මායිම්වද ; |
| නැගෙනහිරට : | මාකොලට යන රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ පාරට මායිම්වද ; |
| දකුණට සහ බටහිරට : | තල්වත්ත සිට විහිදෙන ගම්සභා පාරට මායිම්වද. |

12-1043

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි

1030/1——ආර් ආර් 19829—11,050 (66/12)